# ස්වයං අධ්‍යනයට අත්වැලක්

තෙවන වාරය

ශ්‍රේණිය - 08

නිපුණතා මට්ටම - 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම

## නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් අගයමු.







සැකසුම - H. මැණිකේ අතුකෝරළ

මප/ වත්/ වාවින්න විදුහල

මෙහෙයවීම - නර්තන අංශය

වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස් → මෙය ලිඛිත පාඩමකි.
වැඩි දුරටත් අධ්‍යනය කිරීම සඳහා පාසලේ
ගුරු ඇසුර ලබා ගත යුතුය.

## හැඳින්වීම

මෙම පාඩමෙන් සූදානම් වන්නේ ඔබ 06 හා 07 ශ්‍රේණි වල සම්ප්‍රදායික නර්තන ශිල්පීන් පිළිබඳ ඉගෙන ගත් පරිදි 08 ශ්‍රේණියේදී ද ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් පිළිබඳ විස්තරාත්මකව අවබෝධයක් ලබා ගැනීමට යි. ඒ අනුව,

උඩරට සම්ප්‍රදාය → එස්. පණිභාරත ගුරුතුමා

පහතරට සම්ප්‍රදාය → කේ.එස්. ප්‍රනාන්දු ගුරුතුමා

සබරගමු සම්ප්‍රදාය → ඩී. වී. හීන්නිලමේ ගුරුතුමා වැදගත් වේ. මෙම ශිල්පීන්ගේ ජීවන තොරතුරු, සුවිශේෂ කුසලතා, නර්තන කලාවට සිදුකළ සේවය, පිළිබඳව සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් බලාපොරොත්තු වේ.

## එස්. පණිභාරත ගුරුතුමා



### ජීවන තොරතුරු

- උපත : 1920. 02. 24
- ප්‍රදේශය : හතර කෝරලයේ අල්ගම නම් ග්‍රාමය
- මුල් නම : පානිස්
- පවුලේ විස්තර : සොහොයුරියන් හා බාල සහෝදරයන් තුන් දෙනකු ද එක් බාල සොහොයුරියකි.
- බාල සහෝදරිය : චිත්‍රා අල්ගම (නර්තන ගුරුවරියකි)
- පියා : පබානිස්
- බාප්පා : අල්ගම කිරිගණිතා ගුරුන්නාන්සේ
- පියාගේ බලාපොරොත්තුව පරිදි වෙදකම අතහැර නර්තනයට යොමු විය.
- උඩරට නර්තනය : අල්ගම කිරිගණිතා ගුරුන්නාන්සේගෙන් හා අත්තාගෙන් ප්‍රගුණ කිරීම.
- උඩරට බෙර වාදනය : "පුංචි කිරා" වන ඥාතියෙකුගෙන් ප්‍රගුණ කිරීම.

### සුවිශේෂ කුසලතා

- දවුල් වාදනය
- තම්මැට්ටම් වාදනය
- පහතරට හා සබරගමු නැටුම් පිළිබඳව දක්ෂතා දැක්වීම.
- චන්ද්‍රලේඛා මහත්මියගේ බෙර වාදකයා වශයෙන් ද කටයුතු කර තිබීම.
- ලෝකයේ බොහෝ රටවල නර්තන ප්‍රසංග දැක්වීම සඳහා සංචාරය කරමින් ලංකාවට ඉමහත් කීර්තියක් ලබා දීම.
- 1944 ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවේ ශාන්ති නිකේතනයට යාම.

- එහිදී කථකලි, මනිපුරි වැනි නර්තන මෘදංගම්, පක්වාජ් හා බෝල් වැනි වාදනයන් හැදෑරීම.
- රබීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ ගීත නාටකවල රඟපෑමේ අවස්ථාව ලබා ගැනීම හා එහි දී විශේෂ ප්‍රශංසාවට පත්වීම.
- 'පණීභාරත' යන ගෞරව නාමයෙන් එතුමා පිදුම් ලැබීම.

❖ 1991 දී කැලණි විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය විසින් ආචාර්ය උපාධිය පිරිනැමීම.

## නර්තන කලාවට සිදුකළ සේවය

- පළමු ව ගුරුවරයකු ලෙස සේවය කිරීම.
- මීරිගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්ය තනතුරට පත් වීම.
- රජයේ ලලිත කලායතන විදුහල්පති ධූරයට පත් වීම.
- කැලණි විශ්වවිද්‍යාලයයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ නර්තන අධ්‍යයන අංශ ප්‍රධාන ලෙස එතුමා සේවය කිරීම.
- වසර 31කට වැඩි කාලයක් සේවය කිරීම.

නිර්මාණය කරන ලද නර්තන අංග

ගොයම් කැපීමේ නැටුම

නාරිලතා නැටුම

මොනර නැටුම

දඩයක්කාරයන්ගේ නැටුම

මුද්‍රා නාට්‍ය

කෝච්චිය

පොරපොල්පිටිය

ගුහ අපලය

ගම්මානයේ මල් පිපිලා

බතේ උපත

චිත්‍රපටවල නර්තන නිර්මාණ

සිකුරු තරුව

කුරුලු බැද්ද

අශෝකා

# කේ.එස්. ප්‍රනාන්දු ගුරුතුමා



## ජීවන තොරතුරු

- උපත : 1920. 02. 20
- ප්‍රදේශය : ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ග්‍රාමයේ ලෝකන් වත්ත

## සුවිශේෂ කුසලතා

- නර්තනයට
- ගායනය
- වාදනය
- චිත්‍ර ශිල්පය
- කැටයම් කලාව
- බලි ඇඹීම වැනි සකලවිධ ශිල්පයන් මනාව ප්‍රගුණ කිරීම.

- යක් තොවිල් පිළිබඳ ව මෙන් ම බලියාග පිළිබඳව ද හසළ දැනුමක් තිබීම.
- රංග වස්ත්‍රාභරණ සකස් කිරීමට සුවිශේෂ හැකියාවක් තිබීම.

## නර්තන කලාවට සිදුකළ සේවය

- ශාන්තිකර්මවලට පමණක් සීමා වී පැවති පහතරට නර්තනය ප්‍රසංග වේදිකාවට ගෙන ඒම.
- පහතරට නර්තන ආචාර්යවරයකු ලෙස රජයේ සේවයට එක් වීම.
- රජයේ නැටුම් හා මුද්‍රානාට්‍ය විද්‍යාලයේ උපදේශකයකු ලෙස දිගු කලක් සේවය කිරීම.
- පහතරට නර්තන සම්ප්‍රදායය විශ්වවිද්‍යාලය මට්ටමට ගෙන ඒමට කටයුතු කිරීම.
- බෙන්තර ශෛලියේ ප්‍රධාන යක් තොවිලයක් වන සන්නයිකුම පිළිබඳ ව ''සන්නියකුම හෙවත් දහඅට සන්නිය'' නම් කෘතිය සම්පාදනය කිරීම.
- හෙළ රසාංග ඔහුගේ තවත් නිර්මාණ ප්‍රසංගයක් වීම.
- පහතරට නර්තන සම්ප්‍රදායය ප්‍රාසංගික තත්ත්වයට ගෙන ඒම.
- පාසල් පද්ධතියට සුදුසු වන පරිදි නර්තනාංග සැකසීම.

**නිර්මාණය කළ නර්තන අංග**

ගිරිදේවි නැටුම

සළුපාලිය

සුරඹා වල්ලිය

රතිරාග වන්නම

නාරිලතා

**සකස් කළ නාට්‍යවල රංගන ක්‍රම**

ජනවේගය

මලකෝලම්

මාහේනේ රීරි යකා

මිණි සළඹ

- ❖ පණීභාරත, චිත්‍රසේන, නිත්තවෙල ගුණයා යන ප්‍රවීණයන් සමඟ විදේශීය සංචාර ගණනාවකට මෙතුමා සහභාගී වී ඇත.
- ❖ ඉතාලිය, ප්‍රංශය, ඕලන්දය, එංගලන්තය, කැනඩාව, ඇමෙරිකාව ඔහු සංචාරය කළ රටවල් අතුරෙන් කීපයකි.

# ඩී. වී. හීන්නිලමේ ගුරුතුමා



## ජීවන තොරතුරු

- ❖ උපත : 1914. 03. 14
- ❖ ප්‍රදේශය : රතන්පුර හිදැල්ලන ගලුකාගම

## සුවිශේෂ කුසලතා

- සබරගමු නර්තනය මෙන් ම ගායනය හා වාදනය ප්‍රගුණ කිරීම.
- පහන් මඩු යාගය, කිරි මඩු යාගය, නව ග්‍රහ බලි ශාන්තිකර්ම පිළිබඳ සුවිශේෂ හැකියාවක් දැක්වීම.
- දේව ස්තෝත්‍ර හා යක්ෂ ස්තෝත්‍ර ගායනයට දක්ෂ වීම.
- යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ආදි කටයුතු ඉටු කිරීම.

## නර්තන කලාවට සිදුකළ සේවය

- සබරගමු සන්නියකුම ගොපලු සමයම, කුමාර සමයම, හැන්දෑ සමයම ආදි ශාන්තිකර්ම පැවැත්වීමට උර දී කටයුතු කිරීම.
- සාම්ප්‍රදායිකව සබරගමු නර්තන කලාව බාල පරම්පරාවට පවරා දීමේ මාහැඟි කාර්යය ඉටු කිරීම.
- පරංගියාවත්තේ පොඩිමහත්තයා (රද්දල්ලේ), කේ. පීටර් බුදනාවල, ජී. වී. පුංචි නිලමේ යන අය ඉන් සුවිශේෂ වීම.
- සබරගමු නර්තනයේ සුවිශේෂිතා හඳුනාගෙන ඒවා පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

- ➢ සමන් දේවාල රාජකාරී නැටුම් කණ්ඩායම භාරව කටයුතු කළ හීන් නිලමේ ගුරුතුමා දේවාභරණ වැඩමවන අවස්ථාවේ දී මංගල දවුල් වාදනය වසර ගණනාවක් ම කර ඇත.